216

IHRA
UNIVERSITY OF COLOMBO

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස (දෙවන සෙමෙස්තරය) 2012

(පවත්වන ලද්දේ 2014 මාර්තු)

## BLE 105 - නෛතික පරිසරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.

(5) උත්තර පත්‍රයේ සියළුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01 i "1815 දී බ්‍රිතාන්‍යයන් උඩරට ප්‍රදේශ අත්පත් කරගත් වකවානුවේදී එවකට පැවති සම්ප්‍රදායානුකූල සිංහල නීතිය ලෙස සැලකෙන උඩරට නීතියේ මූලධර්ම ඇතුලත් ලේඛන හෝ කිසිවක් නොවීය. ශාස්ත්‍රීය ලේඛනයන් සහ අධිකරණය විසින් විවිධ ලේඛනයන්ගේ කෘතීන් උඩරට නීතියේ බලධාරී මූලාශ්‍ර ලෙස සලකා ඇත."

සාධක සහිතව උක්ත මතය පැහැදිලි කරන්න.

ii "උඩරට නීතිය යටතේ සිදු කෙරෙන විවාහයක ස්වරූපය" අනුව උඩරට නීතියේ අදාලත්වයද තීරණය වේ.

උක්ත මතය සමඟ ඔබ එකඟද? ඔබගේ පිළිතුර නිදර්ශන මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02 i අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය (Doctrine of stare decisis) අනුගමනය කිරීමේ නීතිමය පදනම සැකෙවින් පැහැදිලි කරන්න.

ii අධිකරණ පූර්වාදර්ශ න්‍යායෙහි නම්‍යතාවක් ඇතිකර ගනු පිණිස පොදු නීති විනිශ්චයකාරවරු විසින් භාවිත කරනු ලබන ශිල්පීය ක්‍රම සහ උපක්‍රම කවරේදැයි විග්‍රහ කර දක්වන්න.

iii අධිකරණ පූර්වාදර්ශ මූලධර්මයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක කවරේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 20)

03 i මුස්ලිම් නොවන රටක් වන ශ්‍රී ලංකාව වැනි ආගම මත පදනම් නොවූ රාජ්‍යයක පුද්ගල නීතියක් ලෙස ආගමානුකූල නීතියක් ආදේශ කර ගැනීමේදී නොයෙකුත් ප්‍රශ්නවලට තුඩු දිය හැකි අතර ගැටීමක් හට ගැනීමට ඉඩ ඇති බව පෙනේ.

උක්ත මතය සමඟ ඔබ එකඟද? ඔබගේ මතය උචිත නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

ii ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් නීතිය ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 20)

04 i තේසවලාමෙයි නීතිය ශ්‍රී ලංකාව තුළ යෙදෙන ආකාරය විස්තර කරන්න.

ii පහත දැක්වෙන අවස්ථාවලදී තේසවලාමෙයි නීතිය බලපාන්නේදැයි සලකා බලන්න.

(අ) ඉන්දියාවේ රාමායන් ප්‍රදේශයේ ඉපිද මෙහි විත් ගනේෂ් යාපනයේ පදිංචි වී සිටියි.

(ආ) බ්‍රිතාන්‍ය කාන්තාවක් වූ ඇඩෙලා යාපනයේ දීර්ඝ කාලයක් පදිංචි වී සිටින අතර නයාරු කලපුව අද්දර හෝටලයක් තනා ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි.

(ඇ) නඩරාජා ඉන්දියාවෙන් පැමිණ මධ්‍යම පලාතේ පදිංචි වී සිටියි.

(ඈ) තංගමනී යාපනයේ ඉපිද, එහිම හැදී වැඩී රත්නපුරයේ පදිංචි බණ්ඩාර සමඟ විවාහ වී එහි ජීවත් වෙයි.

(ලකුණු 20)

05 " ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 118 වන වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය දිවයින තුළ ක්‍රියාත්මක වන <u>උසස්ම</u> සහ <u>අවසාන ඉහළතර උසාවිය</u> වේ. "

යටින් ඉරි ඇඳි වචන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයෙන් කුමක් අදහස් වේදැයි විග්‍රහ කරන්න.

(ලකුණු 20)